
Page 3 April 2013.qxd 15/05/2013 05:39 Page 1






බුද්ධ ධර්මයේ අධ්‍යාත්මික හරය හා පදනම අනිත්‍යතා දර්ශනයයි. අනිත්‍ය යන වචනයෙන් නිත්‍ය නොවන හෙවත් නොපවතින බව කියැවේ. එහෙත් බුද්ධාගම හැර අනෙක් හැම ලෝක ආගමක ම දේවත්වයක් ආරෝපනය කරන ලද නිත්‍ය භෞතික පදාර්ථයක් ගැන කියන්නේ ය.

බුද්ධ කාලයේදී ග්‍රීසියෙහි ජීවත් වූ දාර්ශනිකයෝ ද විශ්වයේ පවතින හැම භෞතික වස්තුවක්ම කිසිදිනක කඩා බිඳ දැමිය නොහැකි, නිත්‍ය භෞතික පදාර්ථ යන් වන පරමාණුවලින් නිර්මාණයවී ඇති බව විශ්වාස කළහ. එහෙත් බුදුහිමියනට සමකාලිකව ක්‍රිස්තු පූර්ව 535 සිට 475 දක්වා ග්‍රීසියේ ජීවත්වූ හෙරක්ලීටස් නම් දාර්ශනිකයා " එකම ගඟකට දෙවරක් පා තැබිය නොහැකිය" යි කර ඇති ප්‍රකාශයෙන් කියවෙන පරිදි හැම භෞතික වස්තුවක්ම ගඟක් සේ අනවරතයෙන් ගලායන පරමාණු ප්‍රවාහයකි. ඒ පරමාණු කිසිදිනක බිඳලිය නොහැකි ස්ථිර පදාර්ථයන් ලෙස භෞතික විද්‍යාඥයන් ශතවර්ෂ දෙකකට අධික කාලයක් තිස්සේ විශ්වාස කළ ද, 1919 දී රුතර්ෆෝඩ් නම් විද්‍යාඥයා ජලකර පරමාණුවක් පුපුරුවාහැරීම නිසා සියලුම භෞතික වස්තූන් අනිත්‍ය බව ප්‍රකාශ කරමින් අවුරුදු දෙදහසකට පමණ පෙර බුදු හිමියන් විසින් ඉදිරිපත් කරන ලද අනිත්‍යතා දර්ශනය භෞතික විද්‍යාඥයන්ට ද පිළිගත හැකි තත්වයක් උදා කළේ ය.

දැවැන්තම භෞතික නිර්මාණය වන මුලු මහත් විශ්වය පවා ඇතිවී නැතිවී යන අනිත්‍යක වස්තුවක් බව අවුරුදු දෙදහසකට පමණ පෙර බුදුහිමියන් ප්‍රකාශකළ ද, ඒ ප්‍රකාශයේ සත්‍යතාව දෙසට විද්‍යාඥයන්ගේ අවධානය යොමු වූයේ විශ්වය ඉතා වේගයෙන් ප්‍රසාරණය වෙවී වෙනස්වෙන වස්තුවක් බව 1929 දී එඩ්වින් හබල් දූරේක්ෂයකින් බලා සොයාගත් පසුව බව පෙනේ.

1988 දී ස්ටීවන් හෝකින් විසින් පළකරන ලද **A Brief History of Time** නමැති ග්‍රන්ථයෙහි සඳහන්වන පරිදි කලු ආවාටයක් **(Black Hole)** දැවැන්ත පිපිරීමකින් **(Big Bang)** පසු ප්‍රසාරණය වී නිර්මාණයවන විශ්වය ආපසු සංකෝචනය වී, දැවැන්ත තදවීමකින් (Big Crunch) නැවත කලු ආවාටයක් බවට පත්වේ. විශ්වය කලකදී ප්‍රසාරණය වී තව කලකදී සංකෝචනය වන බව මීට අවුරුදු 2600 කට පෙර බ්‍රහ්මජාල, අග්ගඤ්ඤ, සත්තසුරි යුග්ගමන, මාපුඤ්ඤභායී, අසංඛෙය්‍ය යනාදී සූත්‍රවලදී පෙන්නාදෙන බුදු හිමියෝ ඒ කාල පරාසය සාරාසංඛ්‍ය කල්පයක් ලෙස සඳහන් කරමින් ඒ කල්ප කාලය නියත අවුරුදු ගණනකින් කිව නොහැකි යුග හතරක් ලෙස එම සූත්‍ර මගින් විදහා දැක්වූහ.

අසංඛ්‍ය යන්නෙන් සංඛ්‍යාව කින් කිව නොහැකි දීර්ඝ කාලයක් හැඳින්වේ. " කප්පො විවට්ටති යන්නෙන් කාලයකදී විශ්වය විවෘතව ප්‍රසාරණය වන බවත්, කප්පො විවට්ටො තිට්ඨති යන්නෙන් කලකදී විශ්වය විවෘතව තිබෙන බවත්, කප්පො සංවට්ඨති යන්නෙන් කලකදී විශ්වය සංකෝචනයවී ඇකිලෙන බවත්, කප්පො සංවට්ටො තිට්ඨති යන්නෙන් කලයකදී විශ්වය සංකෝචනයව ඇකිලී තිබෙන බවත් එම සූත්‍රවලින් කියවේ. මේ ප්‍රකාශවලින් ගම්‍යවන්නේ ඇතිවී නැතිවෙන දැවැන්ත විශ්වය පවා අනිත්‍ය බවත්, එම නිසා එම අනිත්‍ය විශ්වයේ කිසිවක් සමග ඇලීම හෝ ගැටීම තේරුමක් නැති බවත් ය.

බුදුහිමියන්ගේ ප්‍රථම ධර්ම දේශනය වන ධම්මචක්කප්පවත්තන සූත්‍ර ඇසූ කොණ්ඩඤ්ඤ හිමියන් සෝවාන් වූයේ යංකිඤ්චි සමුදය ධම්මං තං නිරොධ ධම්මන්ති යනුවෙන් ඇතිවෙන සෑම දෙයක්ම නැතිවෙන බව අවබොධ වෙන ධම්මචක්ඛුං නමැති දහම් ඇස පහළවී මෙනි. පඨම හා දුතිය ලොකධම්ම සූත්‍ර අනුව රහතන් වහන්සේලා, ඇතිවී නැති වෙන අනිත්‍ය ලොකධම්ම සමග නොඇලෙති. නොගැටෙති. එම නිසා උන්වහන්සේලාගේ සිත් අෂ්ට ලෝක ධර්ම ස්පර්ශයෙන් කම්පා නොවෙන බව ඵුට්ඨස්ස ලොක ධම්මෙහි චිත්තං යස්ස නකම්පති යන මහාමංගල සූත්‍ර පාඨයෙන් කියවේ. මින් ගම්‍ය වන්නේ විශ්ව සාධාරණ අනිත්‍යතාවය සාක්ෂාත් වීම අරහත් ඵලයේ පදනම බවයි.

යදනිච්ච සූත්‍රයේ සඳහන් යදනිච්චං තං දුක්ඛංල යං දුක්ඛං තදනත්තා යන බුද්ධ පාඨයෙන් යමක් අනිත්‍යනම් එයම දුක්ඛ බවත්, යමක් දුක්ඛ නම් එයම අනාත්ම බවත් කියවේ. මේ අනුව විශ්ව සාධාරණ ත්‍රිලක්ෂණ යනු වෙනම ඇති ලක්ෂණ තුනක් නොව එකම ධර්මතාවක පැතිකඩ තුනකි. එම නිසා යමක් අනිත්‍ය නම් දුක්ඛතාවත්, අනාත්මතාවත් අවිභේදනීය ලෙස එහිම අන්තර්ගතවී ඇත. අනිත්‍ය යන්නෙන් නිත්‍ය නොවන බව නොහොත් නිතර වෙනස් වන බව නමැති විපරිණාම දුක්ඛය කියවේ.

දුක්ඛ යන්නෙහි නිරුක්ති අර්ථයද පවතින තත්වයක් දූෂණය වී වෙනස් වීම ය. යමක් නිතර එහි පවතින තත්වය වෙනස් වෙමින් දූෂණවේ නම් ඊට ස්ථාවර අනන්‍යතාවක් නොමැත. නිත්‍ය ආත්මයක්ද නැත. අංගුත්තර නිකායේ තික නිපාතයේ චූලවග්ගයේ දී සංඛත ලක්ෂණ පැහැදිලි කරන බුදුහිමියන් සංඛත ධර්මයන්හි ඒ ඒ අවස්ථාවේදී පවතින ස්වරූපය නිතරම වෙනත් ස්වරූපයකට පෙරලේ යයි ඨිතස්ස අඤ්ඤථත්ත පඤ්ඤායති යනුවෙන් පනවන්නේ දුක්ඛ ධර්මයෙහි විපරිණාම දුක්ඛ ලක්ෂණයි.

අනිත්‍යතාව යනුද මේ පෙරළියමයි. කිසිවකට නිත්‍ය අනන්‍යතාවක් ඇති ස්ථිර ආත්මයක් පවත්වා ගෙන යා නොහැක්කේ ද මේ කරුණකොට

***මේ ලෝකයේ ඇති සෑම දෙයක්ම හැමදා නොපවතී. ඒවා කවදා හෝ ඒකාන්ත යෙන්ම නැතිවී යයි. එහෙත් එය වටහා ගන්නට බැරිවීම නිසා කවුරුත් දුක්වෙති. මේ ලිපිය ඒ බව පහදා දෙයි.***

ගෙන බව පැහැදිලි ය.

දුක්ඛ යනු දුක පමණක් නොවේ. සම්මුති අර්ථය අනුව සිදුවන සැප දුකට පෙරළීම පමණක් නොව, දුක සැපට පෙරළීමත් දක්වන්නේ දුක්ඛ ධර්මයට අයත් විපරිණාම දුක්ඛ ලක්ෂණයයි. හැම විපරිණාමයකින් නොහොත් වෙනස්වීමකින්ම විශ්ව සාධාරණ අනිත්‍යතා ධර්මය නිරූපණය කෙරේ. අනිත්‍යවූ හැම සංඛත ධර්මයක්ම ඇතිවී නැතිවේ. එවැනි කිසිවකට නිත්‍ය ආත්මයක් නැත. මෙම සත්‍යය සාක්ෂාත්වී මෝහයෙන් මිදෙන සිත කිසිවකට නොඇලෙන වීතරාගී බවටත්, කිසිවක් හා නොගැටෙන වීතදෝසී බවටත් පත්වී, වීතරාගී, වීතදෝසී, වීතමෝහී, අරහත්භාවය සාක්ෂාත් කර ගනී. නූතන භෞතික විද්‍යාවද මෙම අරහත් භාවයට පාදකවන භෞතික අනිත්‍යතාව විද්‍යාත්මකව තේරුම්ගෙන ඇත.

1970 සිට 1995 දක්වා වර්ධනය වී 1995 දී පරිසමාප්තියට String Theory නමැති සිද්ධාන්ත හයකින් කියවෙන්නේ සියලුම භෞතික වස්තු නිරන්තරවම කම්පනය වෙවී වෙනස් වෙන ස්පන්දනික විශ්ව ශක්ති තරංගයන්ගෙන් නිර්මාණයවී ඇති බව හා ඒ කිසිවකට එම නිරන්තර ස්පන්දන කම්පනයන්ගෙන් තොර නිත්‍ය ආත්මයක් නැති බව ය.

එම නිසා බුදුහිමියන් අවුරුදු 2600 කට පෙර ඉදිරිපත් කරන ලද අනිත්‍යතා සිද්ධාන්තය හා අනාත්ම වාදය එම භෞතික සිද්ධාන්ත යන්ගෙන් ද තහවුරු වේ. භෞතික විද්‍යාවේ සඳහන්වෙන විශ්ව ශක්තියද එකම ස්වරූපයකින් නිත්‍යව නොපවතින අනිත්‍ය ධර්මයකි. නිත්‍ය ස්වරූපයක් පවත්වාගත නොහැකි විශ්ව ශක්තියෙන් නිර්මිත කිසිම වස්තුවකටද නිත්‍ය ස්වරූපයක් පවත්වාගත නොහැක. ඉහත සඳහන් පරිදි විශ්ව ශක්තියෙන් නිර්මිත මුලු මහත් විශ්වයද ඇතිවී නැතිවී යන අනිත්‍ය ධර්ම ස්වරූපයකි. එහෙත් අප අනිත්‍ය ධර්මයන් සමග රාගයෙන් ඇලෙන්නේ ඒවා නිත්‍ය කරගන්නා අභිප්‍රායෙනි. ද්වේෂයෙන් ගැටෙන්නේ ඒවා අනිත්‍ය බව තේරුම් නොගෙනය. අප නිරන්තරවම ජීවිතය සමග පොරබදමින් දුක් විඳින්නේ ඒ අනවශ්‍ය රාගය නමැති මෝහමූලික ඇලීම් හා මෝහමූලික පටිඝය නමැති අනවශ්‍ය ගැටීම් නිසා ය.

♦ ***සම්මානිත මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම***

**Harrow UK**

# Last Word & Farewell !

After 16 years of publication as a monthly newspaper, **Lanka Viththi** has decided to stop publishing it further. This issue will be our last.

This decision was a complicated and often heartbreaking one to make. We have always taken our role in Sri Lankan community very seriously. We are proud of the way we have handled matters pertinent to our motherland, specially during those crucial times in which that land suffered unimaginable terror and hard-ship. We did not lose our grip until we saw the end of that wretched war and we rejoiced when peace and tranquillity returned to our people.

When the **News Fax** printers in Dagenham, Essex, in which we did our paper, recently closed down all of a sudden, leaving us and many other local newspaper publishers in the lurch, Lanka Viththi suffered the worst being unable to find a new printer from London. That was the turning point and that made me think ahead in the direction of the future and the fate of the print media of tomorrow. Then I thought; this is the time to go. When the going is still good, I must take the exit. Not after when people looked other way when they got fed up of reading papers. This idea dawn on me suddenly while I was browsing the web pages looking for printers. Finally I drew the line that this is it and this is the last paper of Lanka Viththi.

This decision is mine, and mine alone. Only three people know about this so far. They tried to persuade me to do the reverse but after listening to my explaining, they kept quiet.

When this paper is out tomorrow, I can imagine how our readers would gasp in dismay. How they would feel I do not know. Not that I do not care about it, but would they know it was the most difficult decision I had to make. I am sorry, if I did it that way.

I will miss all Lanka Viththi readers, here there and everywhere. You have been a part of my life, part of my family and for 16 years Lanka Viththi had been yours visiting you the 10th of every month. Thank you for your support. I will miss you more than words can express. Goodbye!

♦ **Daya Ananda Ranasinghe**

